සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

108
40

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | MF/WBB/02/Notice/D/Div./2002 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.06. 19 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**<u>"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ පිරිනැමීම සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම</u>**

උක්ත කරුණට ද අදාලව ඔබට උපදෙස් දෙනු ලැබූ මගේ සමාංක හා 2023.06.17 දිනැති ලිපිය හා බැඳේ.

02. සුබසාධක ප්‍රතිලාභ දීමනා ලැබීම පිණිස සුදුසුකම් ලැබූ තැනැත්තන් විසින් බැංකු ගිණුම් ආරම්භ කිරීමට හා නාමලේඛනය ප්‍රසිද්ධ කිරීමට අදාළ මගේ ඉලෙක්ට්‍රොනික අත්සන ඇති ආදර්ශ ලිපි තුනෙහි මේ වන විටත් ඔබ වෙත පවරා ඇති බලතල අනුව ඔබේ අනු අත්සන ද තබා නිකුත් කිරීම මැනවැයි යෝජනා කරමි.

03. තවද මූලික තේරීම් ලැයිස්තුව පදනම් කරගෙන බැංකු ගිණුම් විවෘත කිරීමට ඔබ කාර්යාලය හා සම්බන්ධීකරණය වීමට පැමිණෙන බැංකු නිළධාරීන්ට ඔබගේ කාරුණික සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි.

04. මෙම බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා හා සුදුසුකම්ලාභී පවුල්/ තැනැත්තන්ගේ නාම ලේඛන ඔබේ කාර්යාලයේ ග්‍රාමනිලධාරී කාර්යාවල සහ වෙනත් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රසිද්ධ කිරීම අවශ්‍ය ලිපිලේඛන වියදම් හා අභියාචනා හා විරෝධතා කමිටුවල සේවයේ යෙදවීමට ප්‍රමාණවත් නිළධාරීන් සංඛ්‍යාවක් නොමැති වීම නිසා වන ප්‍රවාහන වියදම් දැරීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිර්දේශය අනුව ඉන්ධන දීමනාවක් සඳහා වූ ප්‍රතිපාදන ඔබ වෙත කඩිනමින් ලබාදීමට කටයුතු කරනු ලබන බව ද වැඩිදුරටත් දන්වමි.

05. පුවත්පත්හි ප්‍රසිද්ධ කර ඇති දැන්වීම් අනුව පිළියෙළකර ගත් අභියාචනා/ විරෝධතා අයදුම්පත් ඔබ කාර්යාලයට එදිනෙදා ලැබෙන අනුපිළිවෙළින් දත්ත පද්ධතියට ඇතුළත් කරමින් අභියාචනා/ විරෝධතා ක්‍රියාවලිය කඩිනමින් කිරීමට ද කාරුණික වන මෙන් ඉල්ලා සිටිමි.

බී.විජයරත්න
සභාපති/කොමසාරිස්

කාර්යාලය / அலுவலகம் / Office — Tel: 009411- 2151481, 009411- 2484600/4117, Fax: 009411- 2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail — welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website — www.wbb.gov.lk